# පුවත් පත් නිවේදනයයි

## 2012 වර්ෂය තුළ රක්ෂණ කර්මාන්තයේ සිදු වූ ප්‍රගතිය

2012 වර්ෂයේදී රක්ෂණ කර්මාන්තය ඉහළ ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. 2011 වර්ෂය හා සසඳන විට මුළු දළ ලිඛිත වාරික ආදායම 11.03% කින්ද මුළු වත්කම් ප්‍රමාණය 15.49% කින්ද වර්ධනය වී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් 22 අතරින් සමාගම් 12 ක් ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙවර්ගයේම නියැලී සිටින අතර සමාගම් 07 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පමණක් කරන අතර, සමාගම් 03 ජීවිත රක්ෂණ ව්‍යාපාර වල පමණක් කටයුතු කරයි. සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් 2009 වර්ෂයේ සිට රක්ෂණ ව්‍යාපාරයේ නොයෙදේ.

2012 වර්ෂය තුළ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 87,152 වූ අතර එය 2011 වර්ෂය හා සැසදීමේදී 11.03% වර්ධනයක් පෙන්වයි. 2011 වර්ෂයේ දළ ලිඛිත වාරික ආදායම වූයේ රු.මිලියන 78,491 කි. මෙය ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය ලෙස වෙන්වෙන්ව බැලීමේදී ද 2012 වර්ෂය තුළ පිළිවෙලින් 6.56%ක හා 14.67%ක ආදායම් වර්ධනයක් පෙන්වා ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 49,683කි. (එය 2011 දී රු.මිලියන 43,329කි). ජීවිත රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 37,469 කි. (එය 2011 දී රු.මිලියන 35,162කි).

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| ජීවිත රක්ෂණ ව්‍යාපාරය | 23,613 | 24,005 | 31,152 | 35,162 | 37,469 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | 34,558 | 33,548 | 35,101 | 43,329 | 49,683 |
| **මුළු දළ ලිඛිත වාරික ආදායම** | **58,171** | **57,553** | **66,253** | **78,491** | **87,152** |

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන)



සටහන

1. *දළ ලිඛිත වාරික මත පදනම් වූ ඉහත විශ්ලේෂණයේ 2012 වර්ෂයේ දත්ත විගනණයට පෙර ලබාගත් ඒවා වේ..*
2. *2012 වර්ෂයේ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් උපයනු ලබන වැඩ වර්ජන, කැරළි කෝළාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී විපත් අරමුදලේ වාරික ආදායම රක්ෂණ සමාගම්වල දළ ලිඛිත වාරික ආදායමට ඇතුළත් කර නැත.*
3. *ඉහත විස්තරය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ දත්ත ඇතුළත් කර නැත.*

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය 2012 වර්ෂය තුල ඉහළ ගොස් ඇත. එය රු.මිලියන 307,035කි. 2011 වසර අවසානයේ මුළු වත්කම් ප්‍රමාණය රු.මිලියන 265,419කි.

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| මුළු වත්කම් ප්‍රමාණය (රු. මිලියන) | 155,993 | 181,045 | 222,098 | 265,712 | 307,035 |

රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය




සටහන

1. *ඉහත විස්තරය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ දත්ත ඇතුළත් කර නැත.*
2. *ඉහත කී විස්තරයේ වත්කම්වල අන්තර් අංශ ගණුදෙනු (ජීවිත සහ සාමාන්‍ය) සළකා බලා නැත.*

රක්ෂණ සමාගම් වල වත්කම් වල යම් ප්‍රතිශතයක් රජයේ සුරැකුම් පත්වල ආයෝජනය කිරීම නීතිමය අවශ්‍යතාවයකි. එනම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල වත්කම් ඇතුලත් තාක්ෂණික සංචිතයේ අරමුදලින් 20% රජයේ සුරැකුම් පත්වල ආයෝජනය කළ යුතුය. මේ අනුව පසුගිය වසර තුල 23.17% ක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇත (රු.මිලියන 28,776කි). ඒ හා සමානව ජීවිත රක්ෂණ අරමුදල් වලින් 30% රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කළ යුතු අතර, එය 53.54% ක් දක්වා ආයෝජනය කර තිබේ (රු.මිලියන 97,876කි).

2012 වර්ෂය තුල රක්ෂණ තැරැව්කාර සමාගම් 55 ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ යෙදුණු නමුත් වසර අවසානය වනවිට එය 54 දක්වා අඩුවිය. රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම රු.මිලියන 12,727ක් වූ අතර එය 2011 වර්ෂයේ රු.මිලියන 10,489ක් විය. මෙය 21.34% ක වර්ධනයකි (එය 2011 දී 9.72% කි).

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන) | 8,976 | 8,886 | 9,560 | 10,489 | 12,727 |

රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වලින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම




ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය, වර්ෂ 2000, අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ ආඥා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියාමනය කරනු ලබයි. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, විචක්ෂණශීලී නියාමන ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය වෙනුවෙන් නිසි මග පෙන්වීමක් කරනු ලබයි.

***ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය***

*12.06.2013*